**සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සංරචක I - 2022**

---------------------------------------------------------------

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සංරචක I 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතින්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය අතර 2018 ජූලි 25 දින එළඹි අංක 6228 LK දරන ණය ගිවිසුමේ 5.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ණය ගිවිසුම අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ භාරකාරත්වය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ භාරකාරත්වය ශක්තිමත් කිරීම, ව්‍යාපෘති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ තාක්‍ෂණික සහාය යන සංරචක දෙකක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ.
ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 449,645 කට සමාන වූ එජඩො මිලියන 2,900 වන අතර ඉන් රු. මිලියන 15,505 කට සමාන වූ එජඩො මිලියන 100 ක් සැපයීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 434,140 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ.
ව්‍යාපෘතියේ කටයුතු 2018 අගෝස්තු 30 දින ආරම්භ කරන ලද අතර, 2024 ජූනි 30 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

**1.3 මතය**

2022 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී.
මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 ඡේදය සහ ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතේ 5.1 වගන්තිය | රේඛීය අමාත්‍යාංශයේ ලේකම් / පළාත් සභා ප්‍රධාන ලේකම් විසින් ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස 02කට වරක් රැස්වන බවට සහතික විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා පවත්වා ඇත්තේ එක් මෙහෙයුම් කමිටුවක් පමණි. | රටේ තත්ත්වය අනුව මෙහෙයුම් කමිටු රැස්වීම් පවත්වීමට නොහැකි වූ බව. | ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි දක්වා ඇති චක්‍රලේඛය සහ උපදෙස්වලට අනුකූලව කටයුතු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ 96 ඡේදය. | 2022 වර්ෂය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් ඉදිරිපත් කල අභ්‍යන්තර විගණන සැලැස්මෙහි විදේශ ආධාර වැඩසටහන් සම්බන්ධීකරණය, නියාමනය සහ ඇගයීම ලෙස පොදුවේ සඳහන් කර තිබුණද, ව්‍යාපාතියට අදාළව විගණන ක්‍රියාකාරකම් හඳුනාගෙන හෝ සිදු කර නොතිබුණි. | 2023 ජනවාරි මස විගණන සැලැස්මෙහි අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රියාත්මක කරන ලද විදේශීය ව්‍යාපෘති පරීක්ෂා කිරීම ඇතුළත් කර ඇති බව. | අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කළ යුතුය. |

**2.2. නොසැසඳූ ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2022 වර්ෂය සඳහා සංරචක 1 හි මුළු වියදම රුපියල් මිලියන 291 ක් හා සංරචක II හි වියදම රුපියල් මිලියන 38 ක් වන අතර 2022 වර්ෂයේ ව්‍යාපෘතිය යටතේ දරන ලද මුළු වියදම රුපියල් 329 ක් ලෙස වාර්තා කර තිබුණි. 2022 වර්ෂයේ ප්‍රගති වාර්තාවට අනුව සමස්ත මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 202 ක් වූ අතර, මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර ඇති වියදම් සහ මූල්‍ය ප්‍රගති වාර්තාව අතර වෙනසක් ඇති බව නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශන තථ්‍ය වියදම් මත පදනම්ව සකස් කර ඇති අතර ශාඛාවල දත්ත පදනම් කරගෙන මූල්‍ය ප්‍රගති වාර්තා සකස් කෙරේ. ඉදිරියේදී සැබෑ පිරිවැය මත ප්‍රගති වාර්තා සකස් කරන බව. | ව්‍යාපෘතියේ නිවැරදි වියදම් ගණනය කිරීමට පියවර ගත යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

| සංරචකය | ක්‍රියාකාරකම | 2021 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය ඒකක / ප්‍රතිශතය | ළඟා කරගෙන ඇති කාර්යසාධන ය ඒකක / ප්‍රතිශතය | | | | |
| (අ) | පාසල් ප්‍රදාන | 178 | 65 | 2021 මාර්තු 23 දිනැති අංක 05/2021 චක්‍රලේඛයට අනුව අදියර දෙකකින් පාසල් 178ක් සඳහා රුපියල් මිලියන 177.5ක ප්‍රදානයක් ලබා දී තිබුණි. මෙම ප්‍රදානය භාවිතයට අදාළ මූල්‍ය ප්‍රගතිය 2021 අප්‍රේල් 30 වන | පසුගිය වසර තුළ දේශීය ආර්ථිකය තුළ පැවති මිල ඉහළ යාම සහ ඇතැම් භාණ්ඩවල හිඟය. | පසුගිය වසරේ දේශීය ආර්ථිකය තුළ පැවති මිල ඉහළ යාම සහ ඇතැම් භාණ්ඩවල හිඟය හේතුවෙන් අදාළ ව්‍යාපෘති නියමිත දිනට නිම කිරීමට නොහැකි වීම හේතුවෙන් ඇතැම් පාසල්වල අදාළ ප්‍රගතිය ඇතුළත් වාර්තා දැනට යොමු කරමින් පවතින | ව්‍යාපෘතියේ ප්‍රගතිය ඇගයීමට ලක් කළ හැකි අයුරින් වාර්තා තබා ගත යුතුය. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | විට ඉදිරිපත් කළ යුතුව තිබුණද, මූල්‍ය ප්‍රගතිය ඉදිරිපත් කර තිබුණේ පාසල් 65ක් පමණි. ඒ අනුව ලබා දී ඇති මුළු ප්‍රදානයෙන් සමාලෝචිත වර්ෂයේ වියදම රුපියල් මිලියන 39 ක් වූ අතර එය මුළු ප්‍රදානයෙන් සියයට 22 ක් පමණි. | | බව නිරීක්ෂණය වූ බව. | |
| (ආ) | පාසල් ප්‍රදාන | 174 | 0 | පසුගිය වසරේ ලබා දුන් ප්‍රදානවලට අදාළ අවසන් වාර්තා හෝ මූල්‍ය ප්‍රගතිය ඉදිරිපත් කර නොතිබියදීත්, සමාලෝචිත වර්ෂය තුළ රුපියල් මිලියන 102.7ක් ලබා දී තිබුණි. වසරේ අවසාන මාසයේ අරමුදල් නිකුත් කිරීම හේතුවෙන් 2022 වර්ෂයේ දී ලබා දුන් ප්‍රදාන 2023 අගෝස්තු 31 දක්වා දීර්ඝ කර තිබුණි. | දේශීය ආර්ථිකයේ පිරිහීම සහ දේශීය හා විදේශීය මුදල්වල මූල්‍ය හිඟය. | භාණ්ඩාගාර මෙහෙයුම් මගින් ප්‍රදානය නොලැබීම හේතුවෙන් මෙම ප්‍රදාන මුදල් නියමිත දිනට අදාළ පාසල් වෙත නිකුත් කිරීමට නොහැකි වූ බව. | විසර්ජන සබැඳි දර්ශක සපුරාලීමට සෑම උත්සාහයක්ම ගත යුතුය. |
| (ඇ) | පාසල් ප්‍රදාන | 270 | 09 | 2021 දෙසැම්බර් 10 දිනැති අංක 25/2021 චක්‍රලේඛයට අනුව ජාතික පාසල් සංඛ්‍යාව 1000 දක්වා වැඩි කිරීමේ ව්‍යාපෘතියට අදාළව පාසල් 270ක් සඳහා රුපියල් මිලියන 285.7 ක ප්‍රදානයක් ලබා දී තිබුණි. 2022 දෙසැම්බර් 31 වන දිනට ප්‍රදාන භාවිතා කර අවසන් කල යුතුව තිබුණි. පාසල් 09 කට පමණක් මූල්‍ය ප්‍රගතිය ඉදිරිපත් කර තිබූ අතර අධ්‍යාපන අමාත්‍යාංශය එම ප්‍රදානයන් භාවිතා කිරීම පිළිබඳව පසු විපරම් කර නොතිබුණි. | ගෝලීය වසංගතය, කාර්ය මණ්ඩලයේ ධාරිතාව සීමා කිරීම, ගුරු වැඩ වර්ජන, පාසල් නිතර තාවකාලිකව වැසීම, මිල ඉහළ යාම සහ වෙළඳපොලේ ඇතැම් භාණ්ඩවල හිඟය හේතුවෙන් චක්‍රලේඛ සහ නීති රීති පිළිපැදීමත් සහ ඒවාට අවනත වීම. | ඇතැම් පාසල්වලට මුදල් ලැබීම ප්‍රමාද වීමෙන් පසු උප සැලැස්ම සඳහා අනුමැතිය ලබා ගැනීමේ කටයුතු ද ප්‍රමාද වී ඇති බව හඳුනා ගැනීමට හැකිවීම මෙන්ම ප්‍රගතිය සඳහන් කිරීම ද ප්‍රමාද වී ඇති බව නිරීක්ෂණය වූ බව. | ව්‍යාපෘතියේ ප්‍රගතිය ඇගැයීම සඳහා චක්‍රලේඛයට අනුකූලව කටයුතු කිරීමට ක්‍රියාකළ යුතු අතර ලබා දී ඇති මුදල් පරිහරණයට අදාළ වාර්තා පවත්වාගෙන යා යුතුය. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (ඇ) | ගණිතය සහ ඉංග්‍රීසි ඉගෙනුම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන. | 60% | තවම ගණන් කර නොමැත | පාසල් අධ්‍යයන කාලය 2023 මාර්තු දක්වා දීර්ඝ කිරීම හේතුවෙන් පළාත් 9ක පාසල් 500ක ක්‍රියාත්මක මෙම වැඩසටහනේ 2022 වසර සඳහා අපේක්ෂිත ප්‍රගතිය සියයට 60ක් විය. කෙසේ වෙතත්, ප්‍රගතිය මැන බැලීම ප්‍රමාද වූ අතර, විගණන දිනය වන විටත් වැඩසටහනේ ප්‍රගතිය ඇගයීම සිදු කර නොතිබුණි. | පාසල් අධ්‍යයන කාලය දීර්ඝ කිරීම | සාමාන්‍ය ඇගයීම් විභාගයේ මුද්‍රිත ප්‍රශ්න පත්‍ර 2023.05.17 දින අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලැබී ඇති අතර එම ප්‍රශ්න පත්‍ර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු වෙත බෙදා හැරීම දැනටමත් ආරම්භ කර ඇත. මෙම පරීක්ෂණ 2023.06.30 දිනට පෙර පළාත් මට්ටමින් පවත්වා සියලු ලකුණු විශ්ලේෂණයන් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දෙන ලෙස ද දැනුම් දී ඇති බව. | නිශ්චිත ඉලක්ක සපුරා ගැනීම සඳහා සෑම උත්සාහයක්ම ගත යුතුය. |
| (ඉ) | ජාතික අධ්‍යාපන ආයතනයේ ක්‍රියාකාරකම් | 11 | 0 | ප්‍රගති වාර්තාවට අනුව කටයුතු 11ක් ආරම්භ කර නොතිබුණි. | ප්‍රතිසංස්කරණ යෝජනා අමාත්‍යාංශකැබිනට් අනුමැතිය සඳහා තබා ඇත. | 2023.03.13 දිනැති ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබුණු ලිපියට අනුව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට ජනාධිපතිවරයාගේ නිල අනුමැතිය ලැබෙන තෙක් අමාත්‍යාංශ කැබිනට් අනුමැතිය සඳහා ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කිරීම නතර කර ඇත. එබැවින් 1 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා විෂයමාලාවට අදාළ කටයුතු තාවකාලිකව නතර කර ඇති බව. | නිශ්චිත ඉලක්ක සපුරා ගැනීම සඳහා සෑම උත්සාහයක්ම ගත යුතුය. |
| (ඊ) | අමාත්‍යාංශයේ ප්‍රගතිය | 32 | 0 | 2022 වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර ඇති කාර්යයන් අතරින් ශාඛා 07කට අයත් කාර්යයන් 32 ක් කිසිදු ප්‍රගතියක් ලබා නොතිබූ අතර ශාඛා 06කට අයත් කාර්යයන් 13 ක ප්‍රගතිය සියයට 50කට වඩා අඩුවී තිබුණි. | රට තුළ පෙර නොවූ විරූ ආර්ථික, සමාජීය සහ සෞඛ්‍ය ගැටලුකාරී තත්ත්වය. | සමාලෝචිත වර්ෂය තුළ රටක් වශයෙන් ශ්‍රී ලංකාවට පෙර නොවූ විරූ ආර්ථික, සමාජීය සහ සෞඛ්‍ය ගැටලුකාරී තත්ත්වයකට මුහුණ දීමට සිදු විය. එම තත්ත්වය තුළ අරමුණු ඉටුකර ගැනීමට විකල්ප ක්‍රියාමාර්ග ගනු ලැබීය. බොහෝ වැඩසටහන් අන්තර්ජාලය හරහා සිදු කරන ලද අතර මූල්‍ය ප්‍රගතියක් නොමැති බව. | නියමිත කාල සීමාව තුළ සැලසුම් කළ ක්‍රියාකාරකම් සිදු කළ යුතුය. |

### 3.2 ව්‍යාපෘති අරමුණු වලින් බාහිර ගෙවීම්

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ මෙහෙයුම් අත්පොතට අනුව, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය යටතේ ගණිතය ඉගෙනීම වැඩිදියුණු කිරීම, ඉංග්‍රීසි භාෂා ඉගෙනීම වැඩිදියුණු කිරීම, ඩිජිටල් ඉගෙනීම ප්‍රවර්ධනය කිරීම, අධ්‍යාපන නායකත්ව කළමනාකරණය සහ පුරවැසි අධ්‍යාපනය යන ක්ෂේත්‍ර කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුව තිබුණි. කෙසේ වෙතත්, ගණිතය සහ ඉංග්‍රීසි ඉගෙනීම ප්‍රවර්ධනය සඳහා රුපියල් මිලියන 16ක් වැය කර ඇති අතර, ඉහත විසර්ජන සබැඳි දර්ශකවලට සෘජුව අනුගත නොවන ක්‍රියාකාරකම් සඳහා රුපියල් මිලියන 85 ක් වැය කර තිබුණි. | සංරචක 1 හි වියදම් විශ්ලේෂණයට අනුව ව්‍යාපෘතියේ විෂය පථය තුළ ව්‍යාපෘති අරමුදල් වැඩි වශයෙන් භාවිතා කර ඇති බව පැහැදිලිය. ඒකාබද්ධ අරමුදල් නොමැති බැවින් ද්විතියික අධ්‍යාපනයේ අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා ක්‍රියාත්මක කිරීමට සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ අරමුදල් භාවිතා කරනු ලැබුණු බව. | ව්‍යාපෘතියේ විෂය පථය තුළ අරමුදල් ඵලදායි ලෙස භාවිතා කිරීම පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කළ යුතුය. |
| (ආ) | පොදුරාජ්‍ය මණ්ඩලීය අරමුදල යටතේ ධාරිතා සංවර්ධන වැඩසටහන සඳහා මූල්‍ය රෙගුලාසි 66 යටතේ රුපියල් මිලියන 4.6ක් මාරු කර තිබුණද, වැඩසටහනේ අදාළ වියදම් මෙම ව්‍යාපෘතිය මගින් සිදු කර ඇති අතර, එම වියදම් සිදු කර ඇත්තේ ව්‍යාපෘතියේ විෂය පථයට පරිභාහිරව බව නිරීක්ෂණය විය. | පිළිගනිමි. | ව්‍යාපෘතියේ විෂය පථය තුළ අරමුදල් ඵලදායි ලෙස භාවිතා කිරීම පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කළ යුතුය. |

### 3.3 මතභේදාත්මක ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක විවිධ වැඩසටහන් වලට අදාළ කටයුතු සඳහා අමාත්‍යාංශ පරිශ්‍රයේ ආසන 25ත් 320ත් අතර ප්‍රමාණයේ දේශන ශාලා සහ කමිටු රැස්වීම් ශාලා 06ක් තිබුණද, අමාත්‍යාංශයෙන් පිටත බාහිර දේශන ශාලා භාවිත කිරීම සඳහා ශාලා ගාස්තු වශයෙන් රුපියල් මිලියන 2.5ක මුදලක් ගෙවා තිබුණි. | අමාත්‍යාංශ පරිශ්‍රයෙන් පිටත වැඩසටහන් පැවැත්වීමේ පරමාර්ථය වන්නේ පවරා ඇති කාර්යය සඳහා සම්පත් දායකයින්ගේ පූර්ණ කාලීන දායකත්වය සහ ඒකාග්‍රතාවය සහතික කිරීම බව. | අමාත්‍යාංශයේ සම්පත් ප්‍රයෝජනයට ගනිමින් වියදම් අවම කර ගැනීමට සෑම උත්සාහයක්ම ගත යුතුය. |